SAVINGS

# AIA SMARTBUILDER



aialife.com.lk

HEALTHIER, LONGER, BETTER LIVES

වගකීම්වලින් පිරුණු තරඟකාරී ලොවක් තුළ ඇතැම්විට අනාගත සිහින සැබෑ කරගැනීම මෙන්ම අපේක්ෂාවන් ඉටුකරගැනීම සඳහා වන අවධානය අප වෙතින් ගිලිහෙනුයේ නොදැනුවත්වමය. වර්තමානයේ පවතින වගකීම් සම්භාරය හේතුවෙන් අපි නිතරම අපගේ අනාගත මූල්‍ය සුරක්ෂිතතාවය උදෙසා සිදුකළ යුතු දෑ මගහැර සිටිමු. ඔබ විසින් අපේක්ෂා කරන ලද සුරක්ෂිත අනාගතය පිළිබඳව ඔබේ මුවඟට විශ්වාසයෙන් යුතු සිනහවක් නැගුණු අවසන් මොහොත ඔබ මතකයේ රැඳේද?

**AIA SmartBuilder** සමගින් දැන් ඔබට ආකර්ෂණීය අරමුදලක් ගොඩනැංවීමේ එම අපේක්ෂාව එලෙසින්ම ඉටු කරගත හැකියි. **AIA SmartBuilder** යනු ඔබ ජීවත්ව නොසිටියද ඔබේ ආදරණීයයන්ගේ මූල්‍යමය සුරක්ෂිතතාවය තහවුරු කෙරෙන්නා වූ සැලසුමකි.

# මෙම සැලසුම ඔබට වඩාත්ම සුදුසු රක්ෂණ විසඳුමද?

- ඔබ සතු ඉටු නොවුනු අපේක්ෂාවන් තිබේද?
- ඔබ දිගු කාලීන ප්‍රතිලාභ සහිත කෙටි කාලීන ආයෝජනයක් කෙරෙහි අවධානය යොමු කිරීමට කැමතිද?
- ඔබ ජීවත්ව නොසිටියද ඔබෙන් යැපෙන්නන් වෙත මාසික ආදායමක් හිමිකරදීමට ඔබට අවශ්‍යද?
- ඔබ වියෝ වුවද ඔබේ පවුලේ ජීවන තත්ත්වය සුරක්ෂිත කිරීමට ඔබට අවශ්‍යද?

# AIA SmartBuilder මගින් ඔබ වෙත හිමි වන ප්‍රතිලාභ මොනවාද?

## කෙටි කාලසීමාවකට වාරික ගෙවීමේ හැකියාව

මෙම සැලසුම සඳහා ඔබ හට වාරික ගෙවීමට සිදුවනුයේ වසර 4ක් හෝ 6ක් පමණක් වුවද, ඔබ තෝරාගන්නා දිගු කාලසීමාවක් සඳහා ඔබ වෙත රැකවරණය සැලසේ.

## රක්ෂණවරය කල්පිරීමේදී, එකවර ආයෝජන අරමුදලේ මුළු වටිනාකම හෝ මාසිකව ආදායමක් ලබාගැනීමේ හැකියාව

ඔබේ රක්ෂණවරය කල්පිරීමේදී සම්පූර්ණ කල්පිරීමේ ප්‍රතිලාභය එකවර ලබාගැනීමේ හෝ තෝරාගත් වසර 10 - 30 අතර කාලසීමාවක් තුළ මාසික ආදායමක් ලෙස ලබාගැනීමේ අවස්ථාව ඔබ සතු වේ.



## හදිසි අවස්ථාවකදී මුදල් ආපසු ලබාගැනීමේ හැකියාව

වාරික ගෙවීමේ කාලසීමාව සම්පූර්ණ වූ පසු, රක්ෂණාවර කාලසීමාව තුළ හදිසි අවස්ථාවකදී, එක් වරක් පමණක්, ආයෝජන අරමුදලින් 15% ක් දක්වා මුදල් නැවත ලබාගැනීමේ හැකියාව.

## ඔබටම ගැළපෙන ජීවිතාවරණයක්

AIA SmartBuilder මගින් ඔබේම අවශ්‍යතාවලට ගැළපෙන පරිදි සකසා ගත හැකි ජීවිතාවරණයක් ඔබ වෙත පිරිනැමේ.

## අනපේක්ෂිත වියෝවකදී...

ඔබෙන් ප්‍රතිලාභ හිමිවන යැපෙන්නන් වෙත එසැණින් ජීවිතාවරණ ප්‍රතිලාභයද (මරණයට හේතුව හදිසි අනතුරක් නම් සහ හදිසි අනතුරු ප්‍රතිලාභය තෝරාගෙන ඇත්නම් මෙම අගය දෙගුණ වේ), රක්ෂණාවරය කල්පිරීමේදී, තෝරාගනු ලැබූ පරිදි ගොඩනැගී ඇති අරමුදල එකවර මුදලක් ලෙස හෝ මාසික ආදායමක් ලෙස හිමි වේ.

වාරික ගෙවීමේ කාලසීමාව තුළදී මරණය සිදුවුවහොත් ජීවිතාවරණ ප්‍රතිලාභයට අමතරව, AIA මගින් ඔබ වෙනුවෙන් අඛණ්ඩව ඔබේ වාරික ගෙවීම සිදුකර රක්ෂණාවරය පවත්වා ගෙන යමින් ඉහත දැක්වුනු ප්‍රතිලාභ ඔබේ ආදරණීයයන් වෙත හිමි වන බව තහවුරු කරනු ඇත.

## AIA SmartBuilder සැලසුම සමග පිරිනැමෙන ලාභාංශ

AIA SmartBuilder සැලසුම සමග පිරිනැමෙන සුවිශේෂී ලාභාංශ ක්‍රමය තුළින් ඔබට ලබාදෙන වාර්ෂික ලාභාංශ, ඔබේ අරමුදලේ අගය වසරක් පාසා ඉහළ නංවයි. මෙහිදී ඔබේ අරමුදල වසරක් පාසා වර්ධනය වන්නේ එම වසරට අදාළ සහතික කළ ලාභාංශ අනුපාතය (ගාස්තු අඩු කිරීමෙන් පසු) හෝ ප්‍රකාශිත ලාභාංශ අනුපාතය (ගාස්තු අඩු කිරීමෙන් පසු) යන දෙකෙන් වැඩි අගයෙනි.

ගෙවනු ලබන මූලික වාරික සහ අමතර වාරික (Top-up) වෙන් කිරීමේ ගාස්තු ගැලපීමෙන් පසු, රක්ෂණාවර හිමියාගේ අදාළ ආයෝජන ගිණුමට බැර කෙරේ. ලාභාංශද ආයෝජන ගිණුමට බැර කෙරෙන අතර ඒ අනුව ඔබගේ ආයෝජන ගිණුම වැල් පොලී ක්‍රමයට වර්ධනය වනු ඇත. අදාළ ගාස්තු මෙම ආයෝජන ගිණුමෙන් අඩු කරනු ලැබේ.

වාරික ගෙවීමේ කාලසීමාවෙන් පසුව, ඔබගේ ආයෝජන අරමුදලෙන් අතිරේක ජීවිතාවරණ ප්‍රතිලාභයට සහ හදිසි අනතුරු ප්‍රතිලාභයට (තෝරාගෙන ඇත්නම්) අදාළ ගාස්තු අඩු කෙරෙනු ඇත.

# ඔබගේ අරමුදල වර්ධනය වන ආකාරය

2017 දී ඔබේ වයස අවුරුදු 35 ක්නම්, අවුරුදු 6 ක වාරික ගෙවීමේ සැලසුමක් (සැලසුමේ කාලසීමාව අවුරුදු 20 ක්) රුපියල් 100,000ක වාර්ෂික මූලික වාරිකයකට සහ ජීවිතාවරණය වාර්ෂික මූලික වාරිකය මෙන් 15 ගුණයක් වන සේ ලබාගත්තේනම් ඔබගේ ප්‍රක්ෂේපිත කල්පිරීමේ ප්‍රතිලාභය පහත දැක්වේ.

| අරමුදලේ විස්තර | උපකල්පිත ලාභාංශ අනුපාතයන් | | |
|---|---|---|---|
| | 4% වාර්ෂික (p.a.) | 8% වාර්ෂික (p.a.) | 12% වාර්ෂික (p.a.) |
| ප්‍රක්ෂේපිත කල්පිරීමේ ප්‍රතිලාභය | 829,864 | 1,680,810 | 3,275,517 |

ශ්‍රී. ල. රු.

ඔබ තෝරාගෙන ඇත්තේ අවුරුදු 15 ක කාල සීමාවක් සඳහා මාසික ආදායමක් ලබාගැනීමටනම්, ප්‍රක්ෂේපිත මාසික අදායම මෙසේය.

| ප්‍රක්ෂේපිත මාසික විශ්‍රාම වැටුප | උපකල්පිත ලාභාංශ අනුපාතයන් | | |
|---|---|---|---|
| | 4% වාර්ෂික (p.a.) | 8% වාර්ෂික (p.a.) | 12% වාර්ෂික (p.a.) |
| විශ්‍රාම යාමේ වයසේදී | 4,610 | 9,338 | 18,197 |
| 5 වැනි වසර ආරම්භයේදී | 5,240 | 12,355 | 27,875 |
| 10 වැනි වසර ආරම්භයේදී | 6,148 | 17,532 | 47,502 |
| 15 වැනි වසර ආරම්භයේදී | 7,214 | 24,878 | 80,948 |

ශ්‍රී. ල. රු.

ඉහත ප්‍රක්ෂේපිත කල්පිරීමේ ප්‍රතිලාභයන් ගණනය කර ඇත්තේ අදාළ වාරික නියමිත දිනයන්හීදී ගෙවා ඇති බව සහ ලාභාංශ අනුපාතයන් 4%, 8% සහ 12% යටතේ අරමුදල වර්ධනය වන බව උපකල්පනය කරමින් සහ සැලසුමට අදාළ ගාස්තු අඩු කිරීමෙන් පසුවයි.

මෙහි දක්වා ඇති ලාභාංශ අනුපාතයන් සහතික නොකෙරේ. එමෙන්ම මෙම අනුපාතයන් ඔබට ලැබිය හැකි ඉහළම හෝ පහළම අනුපාතයන් ද නොවේ.

ඉහත ප්‍රක්ෂේපිත කල්පිරීමේ ප්‍රතිලාභයට අමතරව, ඔබගේ රැකවරණ ප්‍රතිලාභ පහත දැක්වේ.

| සැලසුමෙහි අන්තර්ගත ප්‍රතිලාභ | මුදල |
|---|---|
| **ජීවිතාවරණ ප්‍රතිලාභය**<br>(මූලික රක්ෂිත මුදල + අමතර ජීවිතාවරණ ප්‍රතිලාභය) | රුපියල් 1,500,000 |
| **වාරික ආරක්ෂණ ප්‍රතිලාභය**<br>මරණයකදී හෝ පූර්ණ නිත්‍ය අකර්මණ්‍යතාවයකදී, ඉදිරි වාරික මුදල් තැන්පත් කිරීමේ වගකීමෙන් නිදහස් වේ. එහෙත් පොරොන්දු වූ ප්‍රතිලාභ සැලසුම් කාලසීමාව තුළ ඒ අයුරින්ම දිගටම ක්‍රියාත්මක වේ. | |

මූලික රක්ෂිත මුදලට අදාළ ආවරණය ලබාදීමට සහ කල්පිරීමේ ප්‍රතිලාභය ගොඩනැගීමට මූලික වාරිකය යොදා ගැනෙනු ඇත. අතිරේක ජීවිතාවරණ ප්‍රතිලාභය සහ වාරික ආරක්ෂණ ප්‍රතිලාභය සඳහා අතිරේක වාරිකයක් අය කෙරෙනු ඇත. එබැවින් ඉහත නිදර්ශිත ප්‍රතිලාභ සඳහා ගෙවිය යුතු මුළු වාර්ෂික වාරිකය ශ්‍රී ලංකා රුපියල් 105,091 ක් වනු ඇත.

## සැලසුම සම්බන්ධ වෙනත් තොරතුරු

ඇතුළත්වීමේ වයස : අවුරුදු 19 - 61 (ඊළඟ උපන් දිනට)

උපරිම කල්පිරීමේ වයස : අවුරුදු 76 (ඊළඟ උපන් දිනට)

වාරික ගෙවීමේ කාලසීමාව : අවුරුදු 4 හෝ 6

රක්‍ෂණාවර කාලසීමාව : අවුරුදු 10 - 20

**සටහන:**

වාරික ගෙවීමේ කාලසීමාව අවුරුදු 4ක් නම්, වාරික ගෙවීම් වාර්ෂිකව සිදු කල යුතුය.

වාරික ගෙවීමේ කාලසීමාව අවුරුදු 6ක් නම් වාරික ගෙවීම් මාසිකව, ත්‍රෛමාසිකව, අර්ධ වාර්ෂිකව හෝ වාර්ෂිකව සිදු කළ හැක.

## අදාළ ගාස්තු

### වෙන්කිරීමේදී අයකිරීම

| සැලසුම් වසර | 1 සැලසුම් වසර | 2 සැලසුම් වසර | 3 සැලසුම් වසර සිට |
|---|---|---|---|
| මූලික වාරිකය මත | 40% | 15% | 0% |
| අමතර වාරික (Top-Up) මත | 4% (සෑම අමතර වාරිකයක් මත) | | |

### පවාරණ ගාස්තුව

| සැලසුම් වසර | 1 සැලසුම් වසර | 2 සැලසුම් වසර | 3 සැලසුම් වසර | 4 සැලසුම් වසර සිට |
|---|---|---|---|---|
| පවාරණ ගාස්තුව | 100% | | | 100% සිට 0% දක්වා* |

* සැලසුම් කාල සීමාව තුළ ක්‍රම ක්‍රමයෙන් පහළ යයි.

### පරිපාලන ගාස්තුව

2017 සඳහා වසරකට රුපියල් 661.25 ක් වන අතර සෑම ජනවාරි පළමු වැනි දිනකදීම වාර්ෂිකව 15% බැගින් ඉහළ යයි.

### අරමුදල් කළමනාකරණ ගාස්තුව

ආයෝජන ගිණුමේ ශේෂයෙන් වාර්ෂිකව 0.75% කි.

### මර්ත්‍යතා ගාස්තුව

සමාගම විසින් මූලික රක්ෂිත මුදල ලබාදීම සඳහා වන වියදමට අදාළ අයකිරීම් මත පදනම් වේ.

## ඔබ කළ යුත්තේ කුමක්ද?

ප්‍රතිලාභ භුක්ති විඳීම සඳහා රක්ෂණ සැලසුමෙහි වාරික ගෙවීමේ කාලසීමාව පුරා නියමිත වෙලාවට වාරික ගෙවීම් කළ යුතුය. පළමු සැලසුම් වසර තුන ඇතුළත ඔබ විසින් ඔබගේ වාරික, දින 30 ක සහන කාලසීමාව තුළ නියමිත පරිදි ගෙවනු නොලැබූ විටකදී, සැලසුම බල රහිත වන අතර, ඔබ වෙත කිසිදු ප්‍රතිලාභයක් හිමි නොවනු ඇත. කෙසේ වුවද කොන්දේසිවලට යටත්ව සැලසුම නැවත බලගැන්වීමේ අවස්ථාව ඔබට හිමි වේ.

ඔබ විසින් ඔබගේ සැලසුම වසර 3 ක් හෝ ඊට වැඩි කාලයක් පවත්වාගෙන යනු ලැබුවේනම්, නියමිත දිනට වාරික ගෙවීම ඔබට අතපසු වුවද, සමාගම මගින් ඔබේ ආයෝජන අරමුදලෙන් සැලසුම් පරිපාලන ගාස්තු, අරමුදල් කළමණාකරණ ගාස්තු, මූලික රක්ෂිත මුදල සඳහා මර්ත්‍යතා ගාස්තුව, අන්තර්ගත ප්‍රතිලාභ සඳහා සහ හදිසි අනතුරු ප්‍රතිලාභ සඳහා ගාස්තු අයකොට බාධාවකින් තොරව ඔබ වෙත රැකවරණ ප්‍රතිලාභ ලබාදෙනු ඇත. එම නිසා, ආයෝජන අරමුදලෙහි ප්‍රමාණවත් ශේෂයක් පවතීනම්, ආර්ථික අසීරුතාවයන්හිදී පවා රැකවරණ ප්‍රතිලාභ ලබාගැනීමට ඔබට හැකිවනු ඇත. ශේෂය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ආයෝජන අරමුදලෙන් ඉහත සඳහන් කරන ලද ගාස්තු සහ වාරික අයකරගත නොහැකි වුවහොත් සැලසුම බල රහිත වනු ඇත. කෙසේ වුවද, ඔබගේ අරමුදලෙහි අඛණ්ඩ වර්ධනය තහවුරු කිරීම සඳහා නියමිත කලට වාරික ගෙවීම වැදගත් වේ. ඒ ඔස්සේ ඔබගේ සිහින සැබෑකරගෙන අවශ්‍යතා ඉටුකරගනිමින් රැකවරණ ප්‍රතිලාභ අත්විඳීමේ අවස්ථාව ඔබ වෙත උදාවනු ඇත. පළමු සැලසුම් වසර 3 සම්පූර්ණ වූ පසු, අත්‍යාවශ්‍ය අවස්ථාවකදී පමණක් ඔබට මෙම සැලසුම පවාරණය කර ඊට අදාළ පවාරණ අගය පවාරණ ගාස්තුවකට යටත්ව ලබාගත හැක. පවාරණය කිරීමකදී සැලසුම බලරහිත වනු ඇත.

## අමතර ප්‍රතිලාභ

### හදිසි අනතුරු ප්‍රතිලාභය

හදිසි අනතුරකින් සිදුවන වියෝවකදී ඔබේ යැපෙන්නන්හට මෙයින් වැඩි රැකවරණයක් හිමිවේ. එයට අමතරව ඔබට නිත්‍ය අකර්මන්‍යතාවයකට මුහුණ දීමට සිදුවුවහොත් මූල්‍යමය රැකවරණය මෙයින් සැලසෙනු ඇත.

රක්ෂිතයා, රක්ෂණවරහිමියා නොවන අවස්ථාවකදී මෙම රක්ෂණ සැලසුමේ ප්‍රතිලාභ රක්ෂණවරහිමියාට අදාළ වන අතර, ආවරණයන් රක්ෂිතයා සඳහා අදාළ වේ.

මෙම පත්‍රිකාව රක්ෂණවරය පිළිබඳ සංක්ෂිප්තයකි. මෙම සැලසුම සම්බන්ධ සම්පූර්ණ විස්තර සඳහා කරුණාකර රක්ෂණ ඔප්පුව බලන්න.

SB - 300000071
V6 - 05/18

# AIA සමූහය පිළිබඳ

AIA සමූහය ආසියා ශාන්තිකර කලාපයෙහි විශිෂ්ටතම ජීවිත රක්‍ෂණ සේවා සම්පාදකයා වේ.



1919
චීනය

1931
හොංකොං

1931
සිංගප්පූරුව

1938
තායිලන්තය

1947
පිලිපීනය

1948
මැලේසියාව

1957
බෲනායි

1972
ඕස්ට්‍රේලියාව

1981
නවසීලන්තය

1982
මැකාවු

1984
ඉන්දුනීසියාව

1987
කොරියාව

1990
තායිවානය

2000
වියට්නාමය

2001
ඉන්දියාව

2012
ශ්‍රී ලංකාව

2013
මියන්මාරය *

2015
කාම්බෝජය

* මියන්මාරයේ ඇත්තේ AIA නියෝජිත කාර්යාලයකි.

**US$ ට්‍රිලියන 1 කට** වැඩි සමස්ත මූලික රක්‍ෂිත මුදලක්

ආසියාවේ **වසර 100 කට ආසන්න** සාඩම්බර ඉතිහාසයක්

**වෙළඳපළ 18 ක මෙහෙයුම්**

**මිලියන 30 කට** අධික තනි පුද්ගල රක්ෂණාවර

**මිලියන 16 කට** අධික සමූහ සැලසුම් සාමාජිකයින්

AIA Insurance Lanka PLC (Co.No.PQ 18) විසින් නිකුත් කරන ලදී. 05/2018

HEALTHIER, LONGER, BETTER LIVES

**AIA ඉන්ෂුවරන්ස් ලංකා PLC**
(Co.No.PQ 18)
AIA ටවර්, 92, ධර්මපාල මාවත, කොළඹ 07
ක්‍ෂණික ඇමතුම්: 011 2310310
ෆැක්ස්: 011 4715892
ඊ-මේල්: lk.info@aia.com